**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email - sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත




# සයිටම් සටන

**නිශ්මං රණසිංහ**

මේ දිනවල තලූමරන්නට ලැබී ඇති අයිටමය සයිටමය වන්නේය.සයිටමයෙන් එන ඩෙකාලා අවුල් වන්නේ ප්‍රමිතියෙන්නම් ඒ වෛද්‍ය විද්‍යාලයේ ප්‍රමිතිය ඉහළ නැංවිය යුතුය.ඒ සඳහා රජයේ රෝහල්වල සායන පහසුකම් ලබා දිම වැළක්වීමෙන් ප්‍රමිතිය ඉහළ නැංවීමට බාධා ඇති වන්නේය. ඒ සඳහා ඇති බාධා ඉවත් කර සායනික පහසුකම් වෙනුවෙන් රජයෙන් සයිටමයෙන් අය කරන මුදල ඉහළ දමා එය රටේ නිදහස් සෞඛ්‍ය සේවයේ මෙන්ම රජයේ වෛද්‍ය සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවල තත්ත්වය ඉහළ නැංවීමට සහ වැඩි සිසුන් පිරිසක් වෛද්‍ය විද්‍යාල සඳහා ඇතුළත් කර ගත හැකි අන්දමට පහසුකම් සැපයීමට යොදා ගන්නට හැකිය.

ගැටුමේ ස්වභාවය ඒ ආකාරයෙන් වූවා නම් හාමුදුරුවන්ට කඳුළු ගෑස් පූජා ඉදිරියේ බැම් වලින් පැන වැඩමවන්නට වන්නේ නැත.අධ්‍යාපන කටයුතුවලට බාධා වන්නේද නැත.මේසයක ඉදගෙන රජයේ වියදමෙන්ම තේ එකක් බී කේක් කෑල්ලක් ද කා වැඩේ නිමා කර ගන්නට තිබිණ.

තව දුරටත් සොයා බැලිය යුත්තේ සයිටමයේ වෛද්‍ය අයිටමයට බඳවා ගන්නා සුදුසුකම් ය. එය එස් බී උන්නැහේ කියනා හැටියට වැඩ 3 යි සම්මාන 2 යි යන ප්‍රමිතියෙන් යුක්තනම් අවුලක් නැත.එය රටටම පොදු ප්‍රමිතියකි.

ආණ්ඩුවේ බඳවා ගැනීම දිස්ත්‍රික් මට්ටමට යද්දී වෙනස් වෙයි.එකම ප්‍රතිපල සීමාවේ නොරැදෙයි.ඒ පළාතෙන් පළාතට ඇති පහසුකම් සළකා ඇති කළ තත්ත්වයක්ය.කෙසේ හෝ දුෂ්කර පළාත්වල ඉහළ ප්‍රතිපල ගන්නා අය ද සොයා බලන විට කොළඹට, මහනුවරට, කුරුණෑගලට හෝ ගම්පහ වැනි තැනෙක පංති ආ උදවිය ය.නමුත් පෙනී සිටින දිසාව මිස පෞද්ගලික පංතිවලට ආ දිශාව ගණනයට අදාළ නැත.

**එසේ නොවනතාක් සටන්පාඨ වලට හිර කර තිබෙන ඔළුවලට නොදැනෙන හිරිකිතයක් විවෘතව මේ දෙස බලා සිටින්නෙකුට දැනෙනු වළක්වන්නට නොහැකිය.**

වටේම කැරකී බලන විට ලක්ෂ 120 ක් දී දොස්තර වීම මෙහි ප්‍රධාන ගැටළුවය. වෛද්‍යවරුන්ට තව දේවල් තිබිය හැකිය. එකක් වෘත්තීය තරගකාරීත්වය වැඩි වීමය.එවිට සැර බාල කරන්නට වීම

8 වන පිටට

